ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මහජන ආරක්ෂක අමාත්‍යාංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු ආරාධනය

**වසරක් සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත VX Rail Cluster Server පද්ධති 04ක සේවා හා නඩත්තු කිරීම වෙනුවෙන් සේවා සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදනය**
**කොන්ත්‍රාත් අංකය (IFB): DIE/PRO/07/2017/36-Vol-IV**

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **වසරක් සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත VX Rail Cluster Server පද්ධති 04ක සේවා හා නඩත්තු කිරීම වෙනුවෙන් සේවා සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදනයට** යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.

3. **රුපියල් පන් දහසක (රු. 5,000.00)** ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් **බත්තරමුල්ල. ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, 05 වන මහලේ,** B පර්යන්තයේ, ප්‍රසම්පාදන අංශයේ, නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙත ඉදිරිපත් කිරීමෙන් පසු **2024.08.09 සිට 2024.08.28 දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** කාල පරිච්ඡේදයේ දී ඉංග්‍රීසි භාෂාවෙන් වූ සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** කාල පරිච්ඡේදය තුළ දී **0112-101559** දුරකතන අංකය අමතා ලබාගත හැකි අතර **2024.08.09** දින සිට **2024.08.28 දක්වා** ඕනෑම වැඩ කරන දිනයක දී **පෙ.ව. 9.00 සිට පස්වරු 3.00 දක්වා** කාර්යාලයට පැමිණ හෝ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය **(www. immigration.gov.lk)** හරහා හෝ නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව සිදු කළ හැක.

5. සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" (Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව වෙන වෙනමම කවරවල බහා එම කවර එකම කවරයක බහා මුද්‍රා තබා පහත සඳහන් ව ඇති ලිපිනයට **2024.08.29** වැනි දින **ප.ව. 2.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් ඒ සඳහා 3 වැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයේ තබා ඇති පෙට්ටියට බහාලීම හෝ සිදු කළ හැක. ලංසු ඇතුලත් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ කොන්ත්‍රාත්කරුගේ නම සහ IFB අංකය සඳහන් කළ යුතුය. භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට **දින හැත්තෑ හතක් (77 ක්)** දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන ඕනෑම දිගුකරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගු භාවයෙන් යුක්ත විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම ඉහත දක්වා ඇති ලිපිනයේ දී පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී ලංසු විවෘත කරන ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**05 වන මහල,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**"සුහුරුපාය",**
**ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**

6. **පූර්ව ලංසු රැස්වීම 2024.08.20** වෙනි දින පැය **2.00** ට බත්තරමුල්ල. ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", **05** වන මහලේ, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේදී පැවැත්වෙනු ඇත.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**05 වන මහල,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**"සුහුරුපාය",**
**ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**